**රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2018**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**<br>ප්‍රමිතියේ අංක 32 ඡේදයට අනුව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මගින් අවශ්‍ය නම් හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ බැරකම් හා ආදායම් සහ වියදම් එකිනෙකට හිලව් නොකළ යුතුය. කෙසේ වෙතත්, වෙළඳ ණයහිමි, සවලීකරණ අත්තිකාරම් ගිණුම්, උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් සහ උපචිත ගිණුම්වල හර ශේෂයන් එම ගිණුම්වල බැර ශේෂවලට එරෙහිව හිලව් කර තිබුණි. එබැවින්, එම ගිණුම්වල බැර ශේෂයන් පිළිවෙලින් රු.39,293,994 ක්, රු.183,873,754 ක්, රු.155,061,389 ක් සහ | 2020 මූල්‍ය වර්ෂයේ සියලුම හර ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. | අස්ථිත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බවට සංස්ථාව සහතික විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | රු.349,822,732 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර. – 16, දේපල, පිරියත සහ උපකරණ**<br>---------------------------------<br>සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද යන්ත්‍ර සහ උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්, මෝටර් වාහන, පරිගණක දෘඩාංග සහ කාර්යාල උපකරණ පිරිවැය පිළිවෙලින් රු.830,124,061, රු.5,646,691, රු.102,931,800, රු.57,910,500 සහ රු.45,827,272 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වැනි වගන්තියේ විධිවිධාන අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රයෝජනවත් ආයු කාලය අනුව වත්කම් නැවත තක්සේරු කිරීම අවශ්‍ය නොවේ. කිසිම ආර්ථික වාසියක් නොමැතිකම මෙයට ප්‍රධානතම හේතුව වේ. | වත්කමක සුන්බුන්වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත අගය පෙර ඇස්තමේන්තු වලට වඩා වෙනස් නම්, එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු බව. |
| (ඇ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර. – 37, ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**<br>---------------------------------<br>එකතුව රු. 131,946,654 ක් වූ අධිභාර සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණු අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2010 සිට 2017 වර්ෂය දක්වා නොගෙවූ එකතු කළ අගය මත බදු සහ 2016 සිට 2017 වර්ෂ සඳහා NBT මත බදු වශයෙන් රු.13,924,025 පනවා තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කළ අතර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ද දන්වා ඇත. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2022.03.31 දින හෝ ඊට පෙර නොගෙවූ බදු පියවන්නේ නම්, ඒ සඳහා පනවන ලද දඩය ඉවත් කෙරෙනු ඇති බව දන්වා ඇත. එබැවින්, මෙම අසම්භාව්‍ය වගකීම අනාගතයේදී ගෙවීමට සිදු නොවනු ඇත. ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගනිමින් ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.5.2 ණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අසාමාන්‍ය බැර ශේෂයන් වශයෙන් ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම් ලෙජර ගිණුම, විශේෂ මුදල් අත්තිකාරම්, සේවා සඳහා අත්තිකාරම්, ශ්‍රම උප කොන්ත්‍රාත්තු අත්තිකාරම්, කොන්ත්‍රාත් ශ්‍රම අග්‍රිම, ලැබිය යුතු රැඳවුම් මුදල් සහ TC ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු.229,625,808, රු.20,855,040, රු.11,498,462, රු.37,250,161, රු.180,856,217, රු.120,100,693 සහ රු.97,774,902 වූ බැවින් එම දිනය වන විට එම ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ණය ශේෂ නිෂ්කාශනය කිරීමට පියවර ගනිමින් තිබේ. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් ඒකල වැඩබිමේ තොග වටිනාකම රු.2,488,994 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගණනය කිරීමේ දෝෂය නිවැරදි කර ඇත. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ණයගැතියන්ගේ හානිකරණ වටිනාකම රු.1,260,672 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ගණනය කිරීමේ දෝෂය නිවැරදි කර ඇත. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ක්ෂය වීම ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) කාර්යාලීය උපකරණ රු.1,607,245 කින් අඩුවෙන් දක්වා තිබුණි. | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 110.2 ක වටිනාකමකින් යුත් ඉඩම සහ ගොඩනැගිල්ල NEMO ආයතනයට අයත්ව නොතිබුණද, ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂයවීම් රු. 5,010,817 ක් සහ වර්ෂය සඳහා ක්ෂයවීම් රු.889,909 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඊ) | සංස්ථාවේ සහ NEMO හි මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අන්තර් ජංගම ගිණුම් ශේෂය අතර රු.70,979,175 ක වෙනසක් නිරීක්ෂණය විය. | NEMO සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර අන්තර් ජංගම ගිණුම් ශේෂයන් සැසඳීමට පියවර ගනිමින් ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර අන්තර් ජංගම ගිණුම් ශේෂය සැසඳීමට අවධානය යොමු කළ යුතු බව. |
| (උ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තහවුරු කිරීම අනුව ලැබිය යුතු ශේෂය අතර රු.116,257,437 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ශේෂය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගිණුම් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ සැසඳීමට පියවර ගනිමින් ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර ශේෂයන් සැසඳීමට අවධානය යොමු කළ යුතු බව. |
| (ඌ) | 2012 සිට 2015 දක්වා කාලයට අදාළව හඳුනා නොගත් රු. 1,328,763 ක තැන්පතු ශේෂයක් NEMO හි මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි. | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |

**1.5.3 නොසැසඳුණු පාලන ගිණුම්**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන වලට අනුව | අදාළ වාර්තාවට අනුව | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| කුලී ආදායම | 79,725,302 | 60,899,650 | 18,825,652 | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර ලෙජර් ශේෂය උපලේඛන සමඟ |

සංසන්දනය කිරීමට අවධානය යොමු කළ යුතු බව.

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ගිණුම් අයිතමය | වටිනාකම | සාක්ෂි නොමැති | | |
| | | රු. | | | |
| (අ) | NEMO හි ආදායම - ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් | 203,587,785 | NEMO හි ලාභ ගණනය කිරීමේ ව්‍යාපෘති විස්තර | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ව්‍යාපෘති සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ ව්‍යාපෘති පිළිගැනීමට ලාභ ගණනය කිරීමේ ව්‍යාපෘති විස්තර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | තොග - NEMO | 6,781,778 | තොග සත්‍යාපන පත්‍රිකා | | තොග සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා තොග සත්‍යාපන පත්‍රිකා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | සේවා සඳහා අත්තිකාරම් - NEMO | 1,282,100 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | | අත්තිකාරම් ශේෂය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව. |
| (ඈ) | වෙළඳ ණයගැති - NEMO | 828,779,897 | ණයගැති තහවුරු කිරීම්, විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | | වෙළඳ ණයගැතියන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව . |
| (ඉ) | ශ්‍රම උප කොන්ත්‍රාත් අත්තිකාරම් - NEMO | 18,217,056 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ශ්‍රම උප කොන්ත්‍රාත් අත්තිකාරම් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව . |
| (ඊ) | ශ්‍රම උප කොන්ත්‍රාත් අත්තිකාරම් (බැර ශේෂය) - NEMO | 3,632,800 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | | වෙළඳ ණයහිමියන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව . |
| (උ) | වෙළඳ ණයහිමි - NEMO | 262,741,890 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | | විවිධ ණයහිමියන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව . |
| (ඌ) | විවිධ ණයහිමි - NEMO | 45,479,048 | වයස් විශ්ලේෂණය | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | ගෙවිය යුතු උප කොන්ත්‍රාත්තු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව .<br>ගෙවිය යුතු වෙනත් බදු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව . |
| | | | | | ආදායම් බදු වියදම් |

| | | | | | |
|---|---|---|---|---|---|
| (එ) | ගෙවිය යුතු උප කොන්ත්‍රාත්තු - NEMO | 23,949,662 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | | සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට සහ පිළිගැනීම සඳහා ගෙවීම් වවුචර් සහ බදු ගණනය කිරීම ඉදිරිපත් කළ යුතු බව |
| (ඒ) | ගෙවිය යුතු වෙනත් බදු - NEMO | 1,851,592 | විස්තරාත්මක උපලේඛන | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත | |
| (ඔ) | ආදායම් බදු වියදම් - NEMO | 110,859,971 | ගෙවීම් වවුචර් සහ බදු ගණනය කිරීම | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු දෑ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය රු. 505,892,674 ක් වසර 05 කට වැඩි කාලයක සිට අයකර ගැනීමකින් තොරව පැවතුණි. | නඩත්තු කාලය අවසන් වූ පසු ව්‍යාපෘති සම්බන්ධයෙන් රඳවුම් ශේෂයන් ණය ගැතියන් වෙත පැවරීමට පියවර ගෙන ඇත. | ලැබිය යුතු රඳවුම් ශේෂයන් කිසිදු ප්‍රමාදයකින් තොරව අයකරගත යුතු බව. |
| (ආ) | වෙළඳ ණයගැතියන් රු. 1,243,824,377 ක් වසර 03 කට වැඩි කාලයක සිට ආපසු අයකර ගෙන නොතිබූ අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 46 කි. | වසර 3 කට වැඩි ශේෂයෙන් රු. මිලියන 294.6 ක් 2021 සහ 2022 මූල්‍ය වර්ෂයන් තුළ ණයගැතියන්ගෙන් අය කර ගෙන ඇත. | හිඟ ශේෂයන් කිසිදු ප්‍රමාදයකින් තොරව අයකර ගැනීම හෝ එම හිඟ ශේෂවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේවා අංශයේ වටිනාකම රු. 5,968,160 ක් වූ කලින් ගෙවීම් ශේෂය පියවීමකින් තොරව වසර 05 කට වැඩි කාලයක සිට පැවතුණි. | 2022 වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගැනීමට කටයුතු කරනු ලැබේ. | කලින් ගෙවීම් ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවිය යුතු බව. |
| (ඇ) | සේවා අංශයේ විදේශ මිලදී ගැනීම් පාලන ගිණුමේ ශේෂය රු.13,734,094 ක් 2012 වර්ෂයේ සිට අයකර නොගෙන පැවතුණි. | ගණනය කිරීමේ දෝෂය නිවැරදි කර ඇත. | හිඟ ශේෂය පියවීම හෝ නිවැරදි කිරීම ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු දෑ**

--------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | -------------- |
| (අ) | ශ්‍රම උප පාලන අත්තිකාරම් රු.11,568,973 ක් පියවීමකින් තොරව වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවතුණි. | මෙම ගැටලුවට ප්‍රධාන හේතුව වන්නේ සේවාදායකයා විවිධ තාක්ෂණික කරුණු හේතුවෙන් ගෙවීම් ප්‍රමාද කිරීම නිසා සිදු කරන ලද කාර්යය සම්බන්ධයෙන් බිල්පත් සහතික කිරීම ප්‍රමාද වීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් පියවීමට හැකියාවක් නොමැත. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මෙම ප්‍රමාදයන් අවම කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගෙන ඇත. | පියවිය හැකි සියලුම දිගුකාලීන හිඟ අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව පියවීමට පියවර ගත යුතු බව. |
| (ආ) | වටිනාකම රු. 156,390,311 ක් වූ ශ්‍රම කොන්ත්‍රාත් අග්‍රිම වසර 05ක ට වැඩි කාලයක සිට පියවීමකින් තොරව පැවතුණි. | මෙම ගැටලුවට ප්‍රධාන හේතුව වන්නේ ගනුදෙනුකරු විවිධ තාක්ෂණික කරුණු හේතුවෙන් ගෙවීම් ප්‍රමාද කිරීම නිසා සිදු කරන ලද කාර්යයක සම්බන්ධයෙන් බිල්පත් සහතික කිරීම ප්‍රමාද වීමයි. එ් හේතුව මත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් | පියවිය හැකි සියලුම දීර්ඝකාලීන හිඟ ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | පියවීමට හැකියාවක් නොමැත. අවසාන වශයෙන් මෙය කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද සචලීකරණ අත්තිකාරම් ආපසු අයකර ගැනීම ප්‍රමාද කිරීමට හේතු වී ඇත. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඉදිරියේදී මෙම ප්‍රමාදයන් අවම කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගෙන ඇත. | |
| **(ඇ)** | ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු රු. 433,417,409 ක සචලීකරණ අත්තිකාරම් මුදල වසර 5ක් පුරා පැවති අතර එම ශේෂ පියවීමට 2018 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | විවිධ තාක්ෂණික සහ වෙනත් හේතූන් නිසා බොහෝ විට ව්‍යාපෘති නියමිත කාල සීමාවන් ඉක්මවනු ලැබේ. ඒ හේතුවෙන් අප වෙත ලැබුණු අත්තිකාරම් මුදලට අදාළ සම්පූර්ණ මුදල අයකර ගැනීමට අමතර කාලයක් ගතවේ. ප්‍රමාදය අවම කර නිශ්චිත කාල සීමාවන් තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට උපදෙස් නිකුත් කර ඇත. | පියවිය හැකි සියලුම දීර්ඝකාලීන හිඟ සචලීකරණ අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව පියවීමට පියවර ගත යුතු බව. |
| **(ඈ)** | වටිනාකම රු. 10,562,150 දක්වා වූ ආදායම් බදු ශේෂය 2013 වසරේ සිට 2017 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර පැවතුණි. | පසුගිය කාලයේ සිට පැවත එන ආදායම් බදු වගකීම වාරික පදනම මත පියවීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් බදු වගකීම් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතු බව. |
| **(ඉ)** | වටිනාකම රු. 513,102,944 ක් වූ ණයහිමි ශේෂයෙන් රු. 210,067,402 ක් වර්ෂ 05 ක සිට පැවත එන ශේෂයන් විය. | සේවාදායකයින් එනම් ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතනවලින් මුදල් ගලා ඒම ප්‍රමාද වීම හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සැපයුම්කරුවන්ට සහ ණය හිමියන්ට නියමිත කාලයට ගෙවීම් කළ හැකි තත්ත්වයක නොමැත. තවද, අතිරික්ත කාර්ය මණ්ඩලය හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ට විශාල ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවේ. | පියවිය හැකි සියලුම දීර්ඝකාලීන හිඟ ණය ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වෙතත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සිය සැපයුම්කරුවන් සහ ණයහිමියන් ප්‍රමාදයකින් තොරව පියවීමට උපරිම උත්සාහයක් දරනු ලැබේ. | |
| **(ඊ)** | ගෙවිය යුතු උපකොන්ත්‍රාත්තු වටිනාකමෙන් රු. 1,440,237,909 ක් වූ මුදලින් රු. 905,118,517 ක් වර්ෂ 05 ක සිට පැවත එන ශේෂයන් විය. | සේවාදායකයින් එනම් ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතනවලින් මුදල් ගලා ඒම ප්‍රමාද වීම හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සැපයුම්කරුවන්ට සහ ණය හිමියන්ට නියමිත කාලයට ගෙවීම් කළ හැකි තත්ත්වයක නොමැත. තවද, අතිරික්ත කාර්ය මණ්ඩලය හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ට විශාල ස්ථාවර පිරිවැයක් දැරීමට සිදුවේ. කෙසේ වෙතත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සිය සැපයුම්කරුවන් සහ ණයහිමියන් ප්‍රමාදයකින් තොරව පියවීමට උපරිම උත්සාහයක් දරනු ලැබේ. | පියවිය හැකි සියලුම දීර්ඝකාලීන ගෙවිය යුතු උප කොන්ත්‍රාත් ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2018 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු වටිනාකම රු. 748,045,632 ක් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මුළු හිඟ මුදලින් හිඟ වැට් බදු වටිනාකම ලෙස ගෙවිය යුතු රු.748,045,632 ක් කොටස් වශයෙන් ගෙවීම් සිදු කර තිබේ. | බදු වගකීම පියවීමට ක්‍රියාමාර්ග ගතයුතු බව . |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 2018 දෙසැම්බර් 31 දිනට ජාතිය ගොඩනැගීමේ බදු රු.72,066,045 ක් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | NBT සහ ESC ගෙවිය යුතු මුදල් කපා හැරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරනු ලැබේ. | බදු වගකීම පියවීමට ක්‍රියාමාර්ග ගතයුතු බව. |
| **(ඇ)** | සංස්ථාවේ එවකට සිටි සභාපතිවරයා විසින් නිකුත් කරන ලද 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2(ඇ) වගන්තිය. | ඇණවුම් සමඟ චෙක්පත් මගින් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වෙතත්, එවැනි අත්තිකාරම් එකතුව රු. 256,635,937 ක් සංස්ථාවේ වර්ෂ 3 ක් තිස්සේ නොපියවා පැවතුනි. තවද, 2018 දෙසැම්බර් 31 වන දිනට ලබා දී ඇති වර්ෂයට වැඩි ඇණවුම් සමග චෙක්පත් අත්තිකාරම් ශේෂය රු.20,085,988ක් NEMO හි නිරවුල් නොවී පැවතුණි. | අත්තිකාරම් පියවීමට වගකීම භාරගත් නිලධාරීන්ට දැනටමත් වහාම පියවන ලෙස දන්වා ඇත . | චක්‍රලේඛයට අනුකූල වීම කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු බව. |
| **(ඈ)** | සංස්ථාවේ එවකට සිටි සභාපතිවරයා විසින් නිකුත් කරන ලද 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 දරන චක්‍රලේඛයේ 4 වැනි වගන්තිය. | භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 14ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට වසර 3ක් පුරා විශේෂ මුදල් අත්තිකාරම් ශේෂයන් රු. 14,263,413ක් පියවා නොතිබුණි. තවද, 2018 දෙසැම්බර් 31 දින | ඔවුන්ගේ වැටුපෙන් අයකර ගැනීමටත් අත්තිකාරම් පියවීමටත් කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයට අනුකූල වීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | වන විට NEMO හි රු.8,653,621 ක් වූ විශේෂ මුදල් අත්තිකාරම් ශේෂයන් පියවා නොතිබුණි. | | |
| (ඉ) | 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | භාණ්ඩාගාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයට අනුව NEMO හි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | NEMO මේ වනතුරු නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූල වීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කළ යුතු බව. |

**1.8** **මූල්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත පහසුකම ඉක්මවා රු.45,430,869 ක බැංකු අයිරාවක් සංස්ථාව විසින් ලබාගෙන තිබුණි. | අයහපත් මුදල් ප්‍රවාහ තත්ත්වයන් හේතුවෙන් අපට මෙම අයිරාව පියවා ගැනීමට නොහැකි විය. කෙසේ වුවද, 2021 වර්ෂයේදී මෙම ඉක්මවා ගිය අයිරාව ණයක් බවට පරිවර්තනය කරන ලදි. | සංස්ථාව තුළ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | මූල්‍ය පිරිවැයෙන් සියයට 34ක් එනම් රු. 96,826,390 ක් බැංකු අයිරා සඳහා වූ පොලී පිරිවැය නියෝජනය කර තිබුණි. | බැංකු අයිරාව සඳහා වන පොලී වැඩි වී ඇත්තේ ස්ථිර අයිරා පොලිය පියවා නොගැනීම හේතුවෙනි. සංස්ථාවේ අයහපත් මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය. | සංස්ථාව තුළ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | පෙර වසරට සාපේක්ෂව බැංකු ණය සඳහා පොලිය 2018 දෙසැම්බර් 31 දිනට රු. 83,317,612 කින් එනම් සියයට 93.8 කින් ඉහළ ගොස් තිබුණි. පොලී සහිත ණය ගැනීම් රු. 1,498,719,820 ක් එනම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 248 කින් වැඩිවී තිබුණු | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2016 වර්ෂයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ලංකා බැංකුවෙන් රු.මිලියන 2,100 ක් ණය ලබාගෙන තිබුණි. වර්තමාන මුදල් ප්‍රවාහ ගැටළුව හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට එහි මුදල් ලැබීම් වැඩි වුවහොත් මිස දීර්ඝ | සංස්ථාව තුළ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| බැවින් අනාගතයේදී ව්‍යාපෘති හරහා ප්‍රමාණවත් ලාභයක් උපයා ගැනීමට සංස්ථාව අපොහොසත් වුවහොත් මූල්‍ය තත්ත්වය තවදුරටත් දුර්වල වනු ඇත. | කාලයක් සඳහා මෙම ණය පියවීමට නොහැකි විය. | |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,757,592,398 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට සාපේක්ෂව පූර්ව වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.1,316,541,721 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු. 441,050,677 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි. අයභාරය සහ අනෙකුත් ආදායමෙහි අඩුවීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාව**

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | ඉදිකිරීම් අංශය විසින් ක්‍රියාවට නංවන ලද රු. 6,816,376,809 ක් වටිනා ව්‍යාපෘති 42 ක් සමාලෝචිත වර්ෂයේදී රු. 508,324,458 ක පාඩුවක් ලබා තිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දිනට එහි මුළු සමුච්චිත පාඩුව රුපියල් 996,917,817 ක් විය. | අදාළ සියලු පාර්ශ්වයන්ට සහ ඉහළ කළමනාකාරීත්වයට ලාභ ආන්තිකය තබා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපදෙස් නිකුත් කර ඇත. ඉහළ ප්‍රගති අධීක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් පාඩු ලබන ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ කළමනාකාරීත්වය මූල්‍ය අලාභ අවම කර ලාභදායිතාව ඉහළ නැංවීමට අවධානය යොමු කළ යුතු බව. |
| **(ආ)** | ඉදිකිරීම් හා උපාංග අංශය මගින් ක්‍රියාත්මක කරන ලද රු.327,438,891 ක් වටිනා ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂයේ දී රු. 30,402,903 ක අලාභයක් ලබා ඇති අතර, 2018 දෙසැම්බර් 31 දිනට එහි මුළු සමුච්චිත පාඩුව රු.72,049,447 ක් විය. | අදාළ සියලු පාර්ශ්වයන්ට සහ ඉහළ කළමනාකාරීත්වයට ලාභ ආන්තිකය තබා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපදෙස් නිකුත් කර ඇත. ඉහළ ප්‍රගති අධීක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් පාඩු ලබන ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ කළමනාකාරීත්වය මූල්‍ය අලාභ අවම කර ලාභදායිතාව ඉහළ නැංවීමට අවධානය යොමු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | යාන්ත්‍රික හා විදුලි අංශය මගින් ක්‍රියාත්මක කරන ලද රු. 74,262,513 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේදී රු.1,263,361 ක පාඩුවක් ලබා ඇති අතර, 2018 දෙසැම්බර් 31 දිනට එහි මුළු සමුච්චිත පාඩුව රු. 11,250,528 ක් විය. | අදාළ සියලු පාර්ශ්වයන්ට සහ ඉහළ කළමනාකාරීත්වයට ලාභ ආන්තිකය තබා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපදෙස් නිකුත් කර ඇත. ඉහළ ප්‍රගති අධීක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් පාඩු ලබන ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ කළමනාකාරීත්වය මූල්‍ය අලාභ අවම කර ලාභදායිතාව ඉහළ නැංවීමට අවධානය යොමු කළ යුතු බව. |
| **(ඇ)** | ප්‍රමිතියෙන් තොර බැවින් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද රු.8,383,000 ක් වටිනා කොන්ක්‍රීට් සිල්පර 1320 ක් වසර 05 කට වැඩි කාලයක් තිස්සේ තොගයේ පැවතුනි. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ආර්ථික අගය එකතු කිරීම කළ හැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගනිමින් පාඩු අවම කිරීමට කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ කළමනාකාරීත්වය නිෂ්පාදනයේ ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර ලාභදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කළ යුතු බව. |
| **(ඉ)** | NEMO විසින් ක්‍රියාත්මක කරන ලද රු. 554,510,917 ක් වටිනා ව්‍යාපෘති 25 ක් සමාලෝචිත වර්ෂයේදී රු. 67,798,319 ක් පාඩු ලබා තිබුණි. | NEMO මේ දක්වා ඔවුන්ගේ නිරීක්ෂණවලට පිළිතුරු දී නැත. | සංස්ථාවේ කළමනාකාරීත්වය මූල්‍ය අලාභ අවම කර ලාභදායිතාව ඉහළ නැංවීමට අවධානය යොමු කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්ය සාධන කෙටුම්පත් වාර්තාව වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 735ක ප්‍රමාදයකින් පසු 2021 ජූලි 28 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු දී නොමැත. | චක්‍රලේඛයට අනුව ක්‍රියා කටයුතු කළ යුතු බව. |